# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION

සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No – 10120

ෆැක්ස් / தொலைநகல / Fax – 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone – 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site – www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail – dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO – 153/2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No – / 2024

දිනය / திகதி / Date – 27/01/2024 පැය1200

## මාධ්‍ය නිවේදනය

**පොලිස් විශේෂ කාර්ය බලකාය විසින් සිදු කරන ලද වැටලීම් සම්බන්ධ තොරතුරු ජනමාධ්‍ය වෙත යොමු කිරිම.**

**01. 2024.01.26වන දින පොලිස් විශේෂ කාර්ය බලකා නිලධාරින් විසින් සිදු කරන ලද නීති විරෝධී මත්පැන් වැටලීම් සම්බන්ධ වාර්තාව පහත පරිදි වේ.**

| වැටලීම් ගණන | අත්අඩංගුවට ගත් සැකකරුවන් ගණන | නීති විරෝධී මත්පැන් ප්‍රමාණය (ලීටර්) | ගෝඩා ප්‍රමාණය (ලීටර්) | වෙනත් දේපල |
|---|---|---|---|---|
| 03 | 03 | 40 | 50 | බුලි 01<br>ගෑස් ලිප් 01<br>ගෑස් සිලින්ඩර් 01<br>තඹ දඟර 01<br>යකඩ බැරල් 01 |

වැටලීම් සිදු කර අත්අඩංගුවට ගන්නා ලද සැකකරුවන් හා දේපල අදාළ පොලිස් ස්ථාන වෙත ඉදිරිපත් කර ඇත.

**02. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා විශේෂ මෙහෙයුම් ඒකකය.**

2024.01.26 වන අද දින දහවල් කාලයේ මහරගම පොලිස් වසමේ මහරගම ප්‍රදේශයේ පොලිස් විශේෂ කාර්ය බලකා විශේෂ මෙහෙයුම් ඒකකයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 12 මිලි ග්‍රෑම් 300 ක්, විද්‍යුත් තරාදි 01 ක්, එම ජාවාරමෙන් උපයා ගන්නා බවට සැකකරන මුදල් රුපියල් 15,000/- ක් සමඟ **සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන මහරගම පොලිස් ස්ථානයට භාර දී ඇත.

අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 27 ක් වූ මහරගම ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ. මහරගම පොලිස් ස්ථානය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

## 03. කේරළ ගංජා සමඟ සැකකරුවකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා කිලිනොච්චිය කඳවුර

2024.01.26 වන අද දින සවස් කාලයේ මාන්කුලම් පොලිස් වසමේ මුරුකණ්ඩි වත්ත ප්‍රදේශයේදී පොලිස් විශේෂ කාර්ය බලකා කිලිනොච්චිය කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **කේරළ ගංජා කිලෝ 03 ග්‍රෑම් 750 ක් කැබ් රථයකින් ප්‍රවාහනය කරමින් සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන මාන්කුලම් පොලිස් ස්ථානය වෙත භාර දී ඇත.

අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 42 ක් වූ මායවනූර් ප්‍රදේශයේ පදිංචිකරුවකු වේ. මාන්කුලම් පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

මෙයට අදාළ ඡායාරූප මේ සමඟ එවමි.






**04.** **බලපත්‍ර නොමැතිව මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා තිරුක්කෝවිල් කඳවුර**

2024.01.26 වන අද දින සවස් කාලයේ තිරුක්කෝවිල් පොලිස් වසමේ රූපස්කුලම් වැව ප්‍රදේශයේදී පොලිස් විශේෂ කාර්ය බලකා තිරුක්කෝවිල් කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර බලපත්‍ර නොමැතිව **මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන තිරුක්කෝවිල් පොලිස් ස්ථානය වෙත භාර දී ඇත.

අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 22ක් වූ පද්මන්වීදිය ප්‍රදේශයේ පදිංචිකරුවකු වේ. තිරුක්කෝවිල් පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**05.** **නීති විරෝධි ලෙස වේ ගඟේ පතල් කැණීම් කටයුතු සිදු කරමින් සිටි සැකකරුවන් පස් දෙනෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා කහවත්ත කඳවුර**

2024.01.26 වන අද දින සවස් කාලයේ රත්නපුර පොලිස් වසමේ වේ ගඟ ප්‍රදේශයේදී පොලිස් විශේෂ කාර්ය බලකා කහවත්ත කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර බලපත්‍ර නොමැතිව **නීති විරෝධි ලෙස පතල් කැණීම් කටයුතු සිදු කරමින් සිටි සැකකරුවන් පස් දෙනෙකු එම කැණීම් කටයුතු සිදු කිරීමට ගන්නා උපකරන තොගයක්ද සමඟ** අත්අඩංගුවට ගෙන ඇහැලියගොඩ මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිට වෙත භාර දි ඇත..

අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 30 ත් 61 ත් අතර පසුවන කරවිට, රත්නපුරය, පාතකඩ ප්‍රෙද්ශයේ පදිංචිකරුවන් වේ. රත්නපුර පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.